සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

25 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

## Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

## ලංකා ඉතිහාසය II

උපදෙස්

- පළමු ප්‍රශ්නයටත්, තවත් ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

01. ඔබට සපයා ඇති සිතියමේ පහත සියළුම ස්ථාන ලකුණු කොට නම් කරන්න.

| | | | |
|---|---|---|---|
| (i) මාතලේ | (ii) පඬුවස්නුවර | (iii) උතුරු පළාත | (iv) ඌරාතොට |
| (v) සලාවත්තොට | (vi) කාවරගාම | (vii) හුරුළුවැව | (viii) ගාල්ල |
| (ix) මිනිහාගල්කන්ද | (x) ගල්ඔය | (xi) මහියංගනය | (xii) ගම්පොළ (ලකුණු 12) |

02. ඉතිහාසය යනු කුමක්ද යන්න,
   (i) ඉතිහාසය පිළිබඳ ඉදිරිපත් වී ඇති විවිධ මත.
   (ii) ඉතිහාසය ඉගෙනීමෙන් ඇති ප්‍රයෝජන.
   යන මාතෘකා ඔස්සේ විවරණය කරන්න. (ල. 16)

03. ඉතිහාසය හැදෑරීමේදී දෙස් විදෙස් මූලාශ්‍රයන්ගෙන් ලැබෙන ආලෝකය අතිමහත්ය.
   (i) ලංකා ඉතිහාසය හැදෑරීමේදී වැදගත්වන ඉන්දීය මූලාශ්‍රයන් තුනක් නම් කරන්න. (ල. 3)
   (ii) මහා වංසයේ සඳහන් දේශපාලනික තොරතුරු පුරාවිද්‍යාත්මක මූලාශ්‍රයන් මගින් සනාථවන අවස්ථාවන් පිළිබඳ විස්තර කරන්න. (ල. 6)
   (iii) මූලාශ්‍රයක් වශයෙන් මහා වංසයේ දැකියහැකි දුර්වලතාවයන් පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 7)

04. ශ්‍රී ලංකාව ජනවාස වීම එකවර සිදුවූ ක්‍රියාවක් නොවේ.
   (i) ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික යුගය ප්‍රධාන අවධි දෙකකට බෙදා වෙන්කර ඇත. ඒ සඳහා පදනම් වූ ප්‍රධානතම සාධකය කුමක්ද? (ල. 1)
   (ii) මුල්කාලීන ප්‍රාග් ඓතිහාසික ජනාවාස ව්‍යාප්ත වූ ප්‍රධාන පරිසර කලාප දෙක කුමක්ද? (ල. 2)
   (iii) පූර්ව ඓතිහාසික යුගය ප්‍රාග් ඓතිහාසික ගල් යුගයෙන් වෙන්කර හඳුනාගත හැකි ප්‍රධාන ලක්ෂණනම් කරන්න. (ල. 4)
   (iv) ශ්‍රී ලංකාවේ ඓතිහාසික යුගය යන්න හඳුන්වා එහි ජනාවාස හා ජීවන රටාවේ විශේෂ ලක්ෂණ කෙටියෙන් හඳුන්වන්න. (ල. 9)

05. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් යටතේ එහි ඓතිහාසික වැදගත්කම සාකච්ඡා කරන්න.
   (i) ලංකා ඉතිහාසය හැඩගැසීමේලා ගංගා හා ගංගා නිම්නවල වැදගත්කම.
   (ii) ශ්‍රී ලංකාවේඉතිහාසය හා නාණක මූලාශ්‍රය
   (iii) මධ්‍ය ශිලා යුගයේ ජනාවාස
   (iv) මහා පරාක්‍රමබාහු රජුගේ විදේශ ප්‍රතිපත්ති (එක් කොටසකට ලකුණු 8 බැගිනි)

06. ශ්‍රී ලංකාවේ මධ්‍යගත දේශපාලන බලයක් ගොඩනැගීම සඳහා පණ්ඩුකාභය, දේවානම්පියතිස්ස හා දුටුගැමුණු යන පාලකයින් අනුගමනය කළ ක්‍රියාමාර්ග පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 16)

07. පොළොන්නරු යුගයේ පාලකයින්අනුගමනය කළ විදේශ ප්‍රතිපත්තිය රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමට පවා හේතු වූ බව විද්වතුන්ගේ අදහසයි.

(i) පළමුවන විජයබාහු රජතුමා සබඳතා පැවැත්වූ විදේශීය රටවල් 2ක් නම් කරන්න. (ල. 2)

(ii) මහා පරාක්‍රමබාහු රජතුමා විසින් ආක්‍රමණය කරන ලද විදේශීය රාජ්‍යන් දෙකක් නම් කරන්න. (ල. 2)

(iii) අනුරාධපුර රාජධානිය බිඳවැටීමෙන් පසු රජරට බිහිවූ චෝළ ආධිපත්‍යයට විරුද්ධව රුහුණේ නායකත්වය ගෙන කටයුතු කළ විදේශීය කුමාරවරු දෙදෙනෙකු නම් කරන්න. (ල. 2)

(iv) උදාහරණ දක්වමින් ඉහත ප්‍රකාශය පිළිබඳ විවරණයක යෙදෙන්න. (ල. 10)

08. රජ රට ශිෂ්ටාචාරයේ ආර්ථික කටයුතු පිළිබඳ පහත සඳහන් මාතෘකා ඔස්සේ විස්තර කරන්න.

(i) කෘෂිකර්මාන්තය (ii) වෙළෙඳම (iii) කර්මාන්ත (ල. 16)

09. පහත මාතෘකා 2ක ඓතිහාසික වැදගත්කම පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) චෝළ පාලන සමයේ ශ්‍රී ලංකාවේ දේශපාලන තත්වය.

(ii) වළගම්බා රජු මුහුණ දුන් අභියෝග හා ඒවා ජයගත් ආකාරය.

(iii) ශ්‍රී ලංකාවේ බුදුදහම ස්ථාපිත කිරීම හා ව්‍යාප්ත වීම.

(iv) අනුරාධපුර රාජධානියේ පරිහාණිය හා බිඳවැටීම. (එක් කොටසකට ලකුණු 8 බැගින්)